
# ශ්‍රී ලංකාවට සන්නිවේදන අධ්‍යයන විෂය හදුන්වා දීම



# විෂයක් ලෙස වර්ධනය වීමට පෙර ලාංකිකයන් සතුව ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය පිළිබඳ අවබෝධයක් තිබූ බවට සාධක:-

- සිංහල අක්ෂර මාලාව සකසා ගෙන තිබීම




- ලේඛනය ආරම්භ වී තිබීම




- පුවත් පත්, සඟරා, පොත් පත් ආදී මුද්‍රිත ප්‍රකාශන බිහිවී තිබීම



# ලංකාවට විෂයක් ලෙස සන්නිවේදනය හඳුන්වා දීම:-

- 1. දෙහිවල කණිෂ්ඨ විද්‍යාලයේ (JUNIOR CAMPUS) පුවත්පත් කලාවේදය පාඨමාලාව (1968-1969) එඩ්වින් ආරියදාස, අයි.එම්. ආර්. ඒ. ඊරියගොල්ල
- 2.1971 කැරැල්ලෙන් පසු විශ්වවිද්‍යාල වලට වෘත්තීය පාඨමාලා හඳුන්වාදීමේදී සන්නිවේදන විෂයද විශ්වවිද්‍යාල වලට හඳුන්වාදීම
- 3. 1973 කැළණිය විශ්වවිද්‍යාලයේ "සන්නිවේදන අධ්‍යනාංශය" ඇරඹීම (මහාචාර්ය විමල් දිසානායක, සුනන්ද මහේන්ද්‍ර , එම්. බී. ආරියපාල, එදිරිවීර සරච්චන්ද්‍ර , එඩ්වින් ආරියදාස, ඩී. සී. රණතුංග, කෛලාසපති)
- 04. 1972 ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ "පුවත්පත් කලාව" ඩිප්ලෝමා පාඨමාලාව හඳුන්වා දීම
- 60 දශකයේදී ලංකා ගුවන්විදුලි සේවය මගින් හා ලේක් හවුස් ආයතනය මගින් පුහුණු පාඨමාලා පැවැත්වීම
- වර්තමානය වන විට විශ්වවිද්‍යාල රැසක මෙම පාඨමාලා ක්‍රියාත්මක වීම.
- පාසල් වල විෂයක් ලෙස හඳුන්වාදීම
- පෞද්ගලික ආයතන මගින්ද පාඨමාලා ක්‍රියාත්මක කිරීම



කොළඹ විශ්ව විද්‍යාලය
கொழும்புப் பல்கலைக்கழகம்
UNIVERSITY OF COLOMBO





කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
களனிப் பல்கலைக்கழகம், இலங்கை
UNIVERSITY OF KELANIYA, SRI LANKA





RAJARATA UNIVERSITY OF SRI LANKA
Main Library
Computer Centre
සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
Faculty of Social Sciences and Humanities





ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ஸ்ரீ ஜயவர்தனபுர பல்கலைக்கழகம்
UNIVERSITY OF SRI JAYEWARDENEPURA

සන්නිවේදනය
හා
මාධ්‍ය අධ්‍යයනය
ගුරු මාර්ගෝපදේශය
12 ශ්‍රේණිය
2018 වසරේ සිට ක්‍රියාත්මක වේ.
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

අ.පො.ස (උසස් පෙළ)
සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
ගුරු මාර්ගෝපදේශය
13 ශ්‍රේණිය
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

01
සන්නිවේදනය හැඳිනවීම
සන්නිවේදනය
අභිමතාර්ථ
සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය ඉගෙනගැනීම ආරම්භ කරන ඔබ විසින් පළමුවෙන් ම සන්නිවේදනය යනු කුමක් ද එය පුද්ගලයාගෙන් ආරම්භ වී විශාල ජනගහණයක් දක්වා පැතිර ගියේ කෙසේ ද එයින් සමාජයට ඇති ප්‍රයෝජන මොනවා ද එයට ඇති වන බාධා මොනවා ද ආදි වශයෙන් මූලික කරුණු කිහිපයක් දැන ගත යුතු ය. මානවයා රංචු වශයෙන් ජීවත් වීමට පුරුදු වූ අතර, ඒ නිසා ම සමාජය බිහි විය. සමාජයේ පැවැත්ම සඳහා සන්නිවේදනය අත්‍යවශ්‍ය වේ. කුමන හෝ සමාජයක සිටින පුද්ගලයන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව පවත්වා ගෙන යන්නේ සන්නිවේදනය මගිනි.
සන්නිවේදනය යන්නෙන් අදහස් වන්නේ පුද්ගලයකු සිය 'හැඟීම්, සිතිවිලි හා අදහස් අන්‍යයන් සමග හුවමාරු කර ගැනීම, ය. ඔබට ද ඔබගේ හැඟීම්, සිතිවිලි හා අදහස් අන්‍යයන් සමග හුවමාරු කර ගැනීමට සිදු වේ. එය ඕනෑ ම කෙනෙකු තුළ ඇති වන අනිවාර්ය අවශ්‍යතාවකි. සන්නිවේදනය හා පුද්ගලයන් අතර පවත්නා සන්නිවේදන සම්බන්ධතාව පිළිබඳ ව මේ පළමු පරිච්ඡේදය තුළ ඔබට ඉගෙන ගත හැකි ය.
නොමිලේ බෙදා හැරීම පිණිසයි
9